ශීර්ෂය 258 - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 258 - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් විසින් කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත යවන ලද තොරතුරු අනුව මිලදී ගෙන තිබුණු වත්කම්වල වටිනාකම රු.10,620,647 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය (ඒසීඒ 6 ආකෘතියට) අනුව එම වටිනාකම රු.10,851,297 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.230,650 ක වෙනසක් පැවතුණි.	වර්ෂය තුළ මිලදී ගැනීම් පිළිබඳව කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත වාර්තා කිරීමේදී, අතපසුවීමකින් රු.230,650ක මුදල එම වාර්තාවට ඇතුළත් කිරීමට නොහැකි වූ බව.	අදාළ නිවැරදි කිරීම් කඩිනමින් සිදු කිරීමට පියවර ගත යුතුය.
(ii)	මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ (ඒසීඒ – 06 අකෘතියේ) දක්වා තිබුණු එකතුව රු.2,316,260,546 ක ගොඩනැඟිලි වටිනාකම හා එකතුව රු.3,958,987,970 ක ඉඩම් වටිනාකම තුළ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් නොවන එකතුව රු.4,950,000 ක ගොඩනැගිලි 03 ක වටිනාකම හා රු.5,000,000 වටිනා ඉඩමක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	බෝපිටිය නිල සෙවන කාර්යාලය පිහිටි ඉඩම සඳහා අත්පත් යෝජනා සකස් කර රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත් වාඩියගොඩ බහු කාර්ය ගොඩනැගිල්ල රජයේ ප්‍රතිපාදන මත දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සිදු කරන ලද ව්‍යාපෘතියක් බැවින් මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කළ බවත්, එම ගොඩනැගිල්ල පිහිටි භූමිය පාතහේවාහැට ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමක් බැවින් පැවැරුම් ඔප්පුවක් මගින් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව වෙත පවරා ඇති	අයිතියක් ඇති වත්කම් පමණක් ගිණුම්වල ඇතුළත් කර නිවැරදි කිරීම් කිරීමටත්, කඩිනමින් අයිතිය පවරාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ගැනීමට පියවර ගැනීමත් කළ යුතුය.

		බවත්, ගලහා නිල සෙවණ කාර්යාලය අත්පත් යෝජනා සකස් කිරිම සඳහා NBRO වාර්තාව ලබා ගැනිමට යොමු කර ඇති බව.	
(iii)	වාර්ෂික වත්කම් සමීක්ෂණය කිරීමකින් තොරව එකතුව රු.6,676,066,957 ක ඉඩම් හා ගොඩනැඟිලි වටිනාකම මූල්‍ය ප්‍රකාශනයෙහි ඒසීඒ 6 ආකෘතියෙහි දක්වා තිබුණි.	ඉඩම් හා ගොඩනැගිලි භාණ්ඩ වට්ටෝරු ලේඛනයට ඇතුළත් නොවීම හේතුවෙන් මු.රෙ. 715 අනුව ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය කර නොමැති බව හා ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ නිවැරදි සමීක්ෂණයක් වාර්ෂිකව සිදු කිරීමේ යම් අපහසුතාවයක් පවතින බවත් විශේෂ සෝදිසි පරීක්ෂණක් 2025 වර්ෂයේදී පැවැත්වීමට නියමිත බව.	වත්කම් සමීක්ෂණය කර නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය.
(iv)	මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ 2024 දෙසැම්බර් 31 ට මඟී ප්‍රවාහන මෝටර් රථ වටිනාකම රු. 216,327,625 ක් ලෙස දක්වා තිබුණද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කළ ලියාපදිංචි වාහන පිළිබඳ තොරතුරු අනුව එහි අගය රු. 248,950,000 ක් වූයෙන් රු. 32,622,375 ක වෙනසක් පැවතුණි.	අතපසුවීමකින් නව තක්සේරු කිරීම් අනුව CIGAS වැඩසටහන යාවත්කාලීන කිරීමට නොහැකිවූ බව.	නිවැරදි අගයන් ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට පියවර ගත යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) උප වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ බෝගම්බර ඇළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය රු. මිලියන 31.8 කට මහනුවර නගර සභාවට පවරා තිබුණ අතර, ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.		
(i)	2023 දෙසැම්බර් 31 දින දක්වා වූ මාස 05 ½ ක් තුළ ව්‍යාපෘතිය ඉටුකර ගැනීම සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණද, විගණිත දිනය වන 2025 මාර්තු 17 දින වන විටත් එම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නිම කිරීමට අපොහොසත් වී තිබුණි. ඍජු ශ්‍රම පදනම අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් මහා නගර සභාවට ගෙවිය යුතු දළ වටිනාකම රු.23,343,746 ක් වුවත්, එම වටිනාකමට වඩා රු.4,750,123 ක් වැඩියෙන් ගෙවා තිබුණි.	පිළිතුර ඉදිරිපත් කර නොමැත.	විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවා ඇති මුදල් අයකර ගැනීමටත්, ව්‍යාපෘතිය කඩිනමින් නිම කරවා ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ii)	කොන්ක්‍රීට් පැති බැම්වල මතුපිට පෘෂ්ඨයේ බොහෝ ස්ථානවල උස් පහත්වීම්, කොන්ක්‍රීට් බැම්වල නියමිත පළල වූ 300 mm වඩා අඩුවෙන් හා මී වද දෝෂ (Honey Combs) සහිතව සුමට නිමාවක් නොමැති ඉදිකිරීම් වෙනුවෙන් රු. මිලියන 2.02 ක් සහ අවිධිමත් ලෙස කම්බි වැර ගන්වමින් කොන්ක්‍රීට් යෙදීම වෙනුවෙන් රු. මිලියන 22.2 ක් ගෙවා තිබුණි.	පිළිතුර ඉදිරිපත් කර නොමැත.	විධිමත් තාක්ෂණික පරීක්ෂණයක් සිදු කර සම්මත පිරිවිතර හා ප්‍රමිතීන්ට අනුව කොන්ත්‍රාත්කරු ලවා ඉදිකිරීම් කරවා ගැනීමට කටයුතු කළ යුතු අතර, රජයට අලාභයක් කර ඇත්නම් එය අයකර ගත යුතුය.
(iii)	පළමු හා දෙවන සැලසුම් අනුව 12 mm කම්බි යොදා ඉදිකිරීම් සිදු කිරීමට සැලසුම් කළද, 16 mm හා 10 mm ප්‍රමාණයෙන් යුත් කම්බි යෙදීම හේතුවෙන් සහ නිසි පරිදි සැලසුම් ඉදිරිපත් කිරීමකින් තොරව මහනගර සභාවේ පැවති කම්බි යොදා මෙම ඉදිකිරීම සිදු කිරීම හේතුවෙන් මුල් ඇස්තමේන්තුවට වඩා කි.ග්‍රෑ.16,700 කින් කම්බි ප්‍රමාණය වැඩි වී තිබුණි.	පිළිතුර ඉදිරිපත් කර නොමැත.	- එම -

(iv)	මුල් චිත්‍ර සැලැස්ම (drawings) අනුව ඇළ මාර්ගයේ කොන්ක්‍රීට් බිත්ති 1200 mm ක් උසැතිව ඉදිකළ යුතු වුවද, මහනුවර මහ නගර සභාවේ අවශ්‍යතාවය මත ඇළෙහි එක් පසෙක වාහන නැවතුම් ස්ථානයක් ලෙස යොදා ගැනීමේ අපේක්ෂාවෙන් එම පැති බිත්ති 3000mm ක් හා 2100mm ක් ලෙස උස් කර ඉදිකර පස් පිරවීම සඳහාත් බිල්පත් ගෙවීම් කිරීම තුළ ආපදා කළමනාකරණ ඒකකය සතු අරමුදල් ව්‍යාපෘතියේ අරමුණට පටහැනිව උපයෝජනය කර තිබුණි.	පිළිතුර ඉදිරිපත් කර නොමැත.	- එම -
(ආ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක සමෘද්ධි අංශය විසින් 2024 වර්ෂය තුළදී, ලබා දී තිබුණු එකතුව රු.67,504,990 ක චක්‍රීය ණයවලින් 2024 දෙසැම්බර් 31 දිනට රු.5,448,474 ක මුදලක් අය කර ගැනීමට පැවති අතර, අය කර ගත නොහැකි බොල් ණය ප්‍රමාණය රු.1,650,507 ක් විය.	කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ප්‍රතිලාභීන් ආර්ථිකමය වශයෙන් දුෂ්කරතාවයන්ට මුහුණපෑමට සිදු වී ඇති බැවින් ණය වාරික නිසි පරිදි අය කර ගැනීමට නොහැකි වූ බවත්, ණය අය කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර කාලීනව ණය අය කිරීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධ පියවර ගැනීමටත්, අය විය යුතු මුදල් කඩිනමින් අය කර ගත යුතු වීම.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
(අ)	2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 23 (iv) ඡේදය	4,288,650	තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 05 ක් බාහිර පාර්ශවකයට උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි.	උප කොන්ත්‍රාත් ලබා දුනහොත් එම සමිති අසාධු ලේඛනගත කිරීමට කටයුතු කරන බව.	රාජ්‍ය මුදල් චක්‍රලේඛයට පටහැනිව කටයුතු කළ පාර්ශවයන්ට එරෙහිව පියවර ගත යුතුය.
(ආ)	2017 ජූනි 26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය	3,635,958	සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින්	වර්ෂය තුළ මිලදී ගන්නා ලද වත්කම් පිළිබඳව කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත වාර්තා කර ඇති නමුත්, අපහරණයන් පිළිබඳව කොම්ප්ට්‍රොලර්	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතුය.

		සමාලෝචිත වර්ෂය තුළ අපහරණය කරන ලද වත්කම් පිළිබඳව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර නොතිබුණි.	ජනරාල් වෙත වාර්තා කර නොමැති බව.	
(ඇ)	2021 දෙසැම්බර් 09 දිනැති අංක 05/2021 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව	6,895,401, 582	මූල්‍ය නොවන වත්කම් සෑම වර්ෂ 05 කට වරක් තක්සේරු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට දක්වා තිබුණු ඉඩම්, ගොඩනැඟිලි හා වාහන තක්සේරු කර වසර 12 කට වැඩි කාලයක් ගතවී තිබුණද, නැවත තක්සේරු කර නොතිබුණි.	ඉඩම්, ගොඩනැඟිලි හා වාහන තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරවා ගැනීමේදී සිදු වන ප්‍රමාදයන් හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටුවේ හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව නිලධාරින්ගෙන් සමන්විත කමිටුවකින් තක්සේරු කර ගිණුම්ගත කර ඇති බවත් ඉදිරියේදී තක්සේරු කිරීමේ කටයුතු තක්සේරු දෙපාර්තමේන්තුව හරහා සිදු කිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කර වත්කම් කාලීනව තක්සේරු කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කළ යුතුය.

3.3 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 දෙසැම්බර් 22 දිනැති අංක එස්සීර්/2022/ඊ/04 දරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු පිළිබඳ උපදෙස් මාලාවේ 2 ඡේදය අනුව අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනය කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක නිලධාරීන් 04 දෙනෙකුට ගෙවා තිබුණු එකතුව රු.1,388,000 ක සමෘද්ධි රාජකාරී දීමනා, පළාත්	ප්‍රතිපාදන ලැබීම් සහ අග්‍රිම ලැබීම් වල ප්‍රමාදයන් සිදු වන බැවින් නියමිත මාසයටම අදාළ දීමනා ලබා දීමට නොහැකිවීම මත මෙම දීමනාවන් ලබා දුන් මාසයේ සේවා නියුක්ති ආදායමෙන් අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනය කිරිම සඳහා සැලකිල්ලට ගෙන ඇති බව.	චක්‍රලේඛ හා විධිවිධාන අනුව බදු අය කිරීමට කටයුතු කළ යුතුය.

සහා රාජකාරී දීමනා, සංවර්ධන ව්‍යාපෘති දීමනා හා රියදුරු දීමනාව සැලකිල්ලට ගෙන නොතිබුණි.

3.4 අවිධිමත් ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කඳුකර දශකය දශවිධ විශේෂ ඒකාබද්ධතා ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය සඳහා රු.9,970,200 ක් වටිනා වායු රයිෆල් හා පෙලට්ස් 174 ක් මිල දී ගෙන තිබුණි. 2024 ඔක්තෝබර් 11 දින අදාළ වායු රයිෆල් හා පෙලට්ස් ඇණවුම් කර තිබුණු අතර, වායු රයිෆල් 89 ක් 2024 දෙසැම්බර් 02 දිනද 85 ක් 2025 ජනවාරි 16 දින ලැබී තිබුණි. එසේ වුවද, ආයතනය වෙත වායු රයිෆල් ලැබීමට පෙර 2024 ඔක්තෝබර් 30 දින යොදා වායුරයිෆල් 174 ම අදාළ පිරිවිතරවලට අනුකූල බව දක්වමින් තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් ලෙස නිලධාරීන් 03 දෙනෙකු අත්සන් කර සියලු වායු රයිෆල් සපයා ගෙන නොතිබියදී 2024 දෙසැම්බර් 31 දින රු.9,970,200 ක්වූ මුළු වටිනාකම සැපයුම්කරුට ගෙවීම්කර තිබුණි.	2024 කඳුරට දශකය සංවර්ධන වැඩසටහනට අදාළ සියළු ගෙවීම් කිරීම 2024 ඔත්තෝම්බර් 30 දිනට අවසන් කළ යුතු බවට දන්වා තිබූ බැවින්, ආයතනය සමඟ දුරකථනයෙන් සාකච්ඡා කර ජනවාරි මුල් සති දෙක තුළ වායු රයිෆල් ලබාදීමේ පොරොන්දුව මත අදාළ චෙක්පත ලියා වායු රයිෆල් 174 ම ලැබීමෙන් අනතුරුව චෙක්පත නිකුත් කළ බව.	අවිධිමත් පරිදි ගෙවීම් කිරීමට අදාළ සියලුම පාර්ශව වෙත විධිමත් පියවර ගත යුතුය.
(ආ)	අස්වැසුම ප්‍රතිලාභීන් පිළිබඳ පසුවිපරම් කටයුතු කිරීම වෙනුවෙන් උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වසම් 46 ක වාර්තා ලැබී නොතිබියදී ඒ සඳහා වූ රු. 392,000 ක දීමනා සඳහා වූ චෙක්පත් ලියා අත රඳවා ගෙන තිබුණි.	ග්‍රාම නිලධාරී වසම් 46ක ග්‍රාම නිලධාරීන් මෙම වැඩසටහන සම්බන්ධ වීමට එකඟතාවය පළ කළද පසුව වෘත්තීය ක්‍රියා මාර්ගයකට සහාය ලබාදීම හේතුවෙන් එම නිලධාරීන් අදාළ රාජකාරී ඉටු කිරීම හා මුදල් ලබා ගැනීම ප්‍රතික්ෂේප කර ඔවුන් විසින් සපයන ලද වාර්තා නැවත ලබා ගැනීමට කටයුතු කළ බවත්, ඒ අනුව මෙම කාර්යය සඳහා වෙන් කරන ලද මුදල් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කළ බව.	සෑම අතින්ම සම්පූර්ණ වුත්, නිවැරදි වුත් ගෙවීම් සඳහා පමණක් චෙක්පත් ලිවිය යුතු අතර, එසේ නොකළ නිලධාරීන් සඳහා විධිමත් පියවර ගත යුතුය.

3.5 බැංකු ගිණුම් මෙහෙයවීම

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාළව එකතුව රු. 164,813 ක හඳුනා නොගත් ගෙවීම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාළව එකතුව රු. 3,486,454 ක හඳුනා නොගත් ලැබීම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	මෙම සියලු හඳුනා නොගත් ලැබීම් සහ ගෙවීම්2024.12.31 දින සිදු වී ඇති බවත්, එම ලැබීම් හා ගෙවීම් සෘජුවම බැංකු ගිණුම වෙත බැර වී ඇති බැවින් හා වැරදීමකින් පළාත් සභා ගිණුම් වලට ගිණුම් ගතවී ඇති බව.	හඳුනා නොගත් ලැබීම් හා ගෙවීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක 2024 දෙසැම්බර් 31 දිනට වෙනත් පුද්ගලයන් හා ආයතන වෙත ගෙවීම් කිරීම සඳහා ලියනු ලැබූ එකතුව රු. 19,693,437 ක චෙක්පත් 196 ක් නිකුත් කිරීමෙන් තොරව අත රඳවාගෙන තිබුණි.	ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් වලට අදාළ ව්‍යාපෘති සියල්ලෙහි වැඩ නියමිත දිනට අවසන් කර නොතිබුණද, අවසන් අදියරේ පැවතීම හේතුවෙන් චෙක්පත් මුද්‍රණය කළ නමුත් නිකුත් කිරීමකින් තොරව අතරඳවාගෙන තිබූ බව.	සැම අතින්ම සම්පූර්ණවූත්, නිවැරදිවූත් ගෙවීම් සඳහා පමණක් චෙක්පත් ලියා ගෙවීම් කළ යුතු වුවත්, නිම නොවූ කාර්යය වෙනුවෙන් වවුචර් සකසා චෙක්පත් ලියූ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.
(ඇ)	වළල ඒ රත්නායක විදුහලේ රුදවුම් බැම්ම ඉදිකිරීමට අදාළව නව ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කර ගැනීමකින් තොරව පැති බැම්මේ වෙනස්වීම් (ඇලවීම) යථාවත් කිරීම වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දින ලියන ලද රු. 4,776,216 ක් වටිනා චෙක්පත විගණිත අවස්ථාව වන 2025 අප්‍රේල් 08 දින දක්වා මාස 03 කට අධික කාලයක් අත රඳවා ගෙන තිබුණි.	මෙම ඉදිකිරීමට අදාළ වවුර්පත් 2024 දෙසැම්බර් 31 දින ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා ඉංජිනේරු නිර්දේශයද ලැබී ඇති බැවින් චෙක්පත ලියන ලද බවත්,ව්‍යාපෘතියේ දෝෂ පසුව වාර්තා වූ බැවින් ආදායකයා වෙත නිකුත් නොකළ බව.	- එම -

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලසුම් කිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 ජනවාරි 24 දිනැති අංක PS/FID/ID/Circulars/1/2024 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛ ප්‍රකාරව ග්‍රාමීය කමිටු යෝජනාවන් ලබා ගැනීමෙන් තොරව පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු. 4,800,000 ක් වටිනා කර්මාන්ත ඉදිකිරීම් හා ද්‍රව්‍ය ආධාර ව්‍යාපෘති 19 ක් සමාලෝචිත වර්ෂය තුළ නිසි ක්‍රමවේදයෙන් බැහැරව මන්ත්‍රී විශේෂ බලපත්‍ර ක්‍රමය යටතේ ක්‍රියාවට නංවා තිබුණි.	විමධ්‍යගත විශේෂ බලපත්‍ර යටතේ ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘති සඳහා ග්‍රාමීය කමිටුවේ අනුමැතියක් ලබා ගැනීමට උපදෙස් ලබා දී නොතිබුණු බවත්, සියලුම ව්‍යාපෘති ශක්‍යතාව පරීක්ෂා කර බලා ක්‍රියාත්මක කළ බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා ග්‍රාමීය කමිටු නිර්දේශය මත ව්‍යාපෘති හඳුනාගෙන ඉටු කිරීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධ පියවර ගත යුතුය.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කඳුකර දශකය 2024 – 2033 දශවිධ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ දිළිඳු පවුල් සඳහා නිවාස පහසුකම් සැළසීමේ ව්‍යාපෘතිය යටතේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ දිළිඳු පවුල් 04 ක් සඳහා රු.500,000 බැගින් රු.2,000,000 ක නිවාස ආධාර ගෙවීමට ප්‍රතිලාභීන් සමඟ ගිවිසුම්ගත වී තිබුණද ප්‍රතිලාභීන් 04 දෙනා සඳහා ගෙවා තිබුණේ රු.1,059,447 ක් පමණක් වූයෙන් එම ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි.	මෙම නිවාස අඩක් නිම කිරීම හේතුවෙන් රු.1,059,447 ක් පමණක් ගෙවා ඇති බවත්, විගණනයෙන් පෙන්වා දීමෙන් අනතුරුව එම ප්‍රතිලාභීන් කැඳවා නිවාස පදිංචියට සුදුසු වන පරිදි සකස් කර ගන්නා ලෙස උපදෙස් ලබා දුන් බවත්, මේ වන විට ප්‍රතිලාභීන් එම නිවාස වල පදිංචි වී සිටින බව.	අපේක්ෂිත නිමවුම් මට්ටම ළඟා කර ගැනීමට වැඩපිළිවෙලක් සකසා කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය.
(ආ)	වර්ෂ 2018 සිට වර්ෂ 2021 දෙසැම්බර් දක්වා වූ කාලය තුළ රු.103,212,106 ක මුදලක් ගෙවා උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැඟිල්ලක් ඉදිකර තිබුණි. එකී කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම්ගත ඇස්තමේන්තු පිරිවිතරයන්ට අනුකූලව ගොඩනැඟිල්ල ඉදි නොකිරීම, ගොඩනැඟිල්ලේ ඉදිකිරීමේ දෝෂ විශාල	2022 ජනවාරි මස 26 වන දින නව ගොඩනැඟිල්ල විවෘත කළ අතර එදින සිටම මෙම දෝෂ තිබුණු බැවින් 2024 වර්ෂයේ රු.2,750,692 ක මුදලක් වෙන් කර ගොඩනැගිල්ල තුළ රාජකාරී කිරීමට හැකිවන පරිදි පිළිසකර කළ බව.	2022 වර්ෂයේදී අදාළ අඩුපාඩු කොන්ත්‍රාත්කරු වෙතින් සකස් කර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.

	ප්‍රමාණයක් පැවතීම, කොන්ක්‍රීට් වහලය නියමිත ප්‍රමිතියෙන් තොරව ඉදිකිරීම හේතුවෙන් ජලය ගොඩනැඟිල්ල තුළට කාන්දු වීම ආදී අඩුපාඩු සැකසීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. 2,750,692 ක මුදලක් වැය කර නැවත පිළිසකර කිරීමට සිදු වී තිබුණි.		
(ඇ)	නියමිත පරිදි පස් පිරවීම් කර නොතිබියදී තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද පැති බැම් ඉදි කිරීමේ ව්‍යාපෘති 03 ක පස් පිරවීමේ කටයුතු වෙනුවෙන් පස් ඝනමීටර් 61.27 ක ප්‍රමාණයක් සඳහා රු. 165,596 ක මුදලක් ගෙවා තිබුණි.	මෙම ව්‍යාපෘතියට අදාළව ලැබුණු ප්‍රතිපාදනවලට අනුව සැකසූ ඇස්තමේන්තුවට ඉදකිරිම් කටයුතු සිදු කළ බව, පැවති අධික වර්ෂාව හේතුවෙන් පස් දෙපසින් සෝදා ගොස් ඇති බව, මින් ඉදිරියට පස් පිරවීම්වලදි සුසංහසනය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන බව හා විගණනයෙන් පෙන්වා දී ඇති ස්ථාන පස් පුරවා අවසන් කර ඇති බව.	නියමිත පරිදි පස් පුරවා එම ව්‍යාපෘති 3 ඵලදායීව නිම කිරීමට වැඩපිළිවෙලක් යෙදිය යුතුය.
(ඇ)	ඉංජිනේරු සැළසුම් සකස් කිරීමේදී ඇති වුණු දුර්වලතාවයක් හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 29,586,375 ක වියදමක් දරා ඉදිකර ඇති වළල ඒ රත්නායක විදුහලේ රැඳවුම් බැම්ම ඉදිකර මාස 2 ක් තුළ ඇලවී ගොස් තිබුණු අතර ව්‍යුහාත්මක සහ භූ විද්‍යා විශේෂඥ උපදෙස් අනුව බැම්ම යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග 2025 අප්‍රේල් 05 දින දක්වාම ගෙන නොතිබුණු අතර බැම්මේ පැවැත්ම අවිනිශ්චිත විය.	වළල ඒ රත්නායක විදුහලේ රැඳවුම් බැම්ම ඉදිකර මාස තුනක් පමණ ගත වීමෙන් පසුව ඇති වූ අධික සුළි කුණාටු තත්ත්වය හා වර්ෂාව නිසා මෙම භූමියට ද බලපෑම් ඇති වූ බවත්, මෙවැනි අවධානමක් සඳහා පැති බැම්ම සැලසුම් නොකරන ලද අතර මෙම ආපදා තත්ත්වය මත සිදු වූවක් බවත්, එසේම ජලය බැස යාම වළක්වා ගැනීමට කටයුතු කර ඇති අතර ඒ සඳහා බැම්මේ ආනතිය වෙනස්වීම වැළැක්වීමට බැම්මට කම්බි සම්බන්ධ කිරීම සිදුකර තත්ත්වය සම්පූර්ණයෙන් පාලනය කර ඇති බව.	තාක්ෂණික විශේෂඥ උපදෙස් ලබාගෙන බැම්මේ නිශ්චිත පැවැත්ම තහවුරු වන ආකාරයට ප්‍රතිකර්ම යෙදීමට කඩිනම් වැඩපිළිවෙලක් යෙදිය යුතුය.
(ඉ)	කැටවල හන්දියේ සිට නැහිනිවෙල මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.23,724,000 ක මුදලකට කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.20,689,384 ක මුදලක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.		

(i)	මාර්ග තලය මීටර් 1500 දිගට, මීටර් 5.5 පළලට සහ මාර්ග දෙපස උරහිස් මීටර් 0.5 ක් පළලින් සකස් කිරීම සඳහා ගිවිසුම්ගත වී තිබුණද, මාර්ගය ඉදිකර තිබුණේ, මීටර් 850 පමණක් බැවින් අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 43 ක් ඉටු කර නොතිබුණි. මාර්ගයේ දිග මීටර් 920 ක් ඉදිකළ බවට බිල්පත් සකස් කර ගෙවීම් කර තිබුණි. ඒ අනුව මාර්ග තලයේ ඉටු නොකළ මීටර් 70 ක කොටස් සඳහා වැඩ විෂය අංක 4.3 හා 4.4 යටතේ ඇස්ෆල්ට් ඇතිරීම වෙනුවෙන් රු.1,540,760 ක්ද වැඩිපුර ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු වෙත ඇස්ෆල්ට් සැපයූ සමාගමෙන් ලබා ගත් තහවුරු කිරීම් අනුව ඇස්ෆල්ට් මෙට්‍රික් ටොන් 844 ක ප්‍රමාණයක් පමණක් කොන්ත්‍රාත්කරු වෙත නිකුත් කර තිබුණි. නමුත් මෙට්‍රික් ටොන් 900 ක් වෙනුවෙන් ගෙවීම් කිරීම හේතුවෙන් මෙට්‍රික් ටොන් 56 ක් සඳහා රු.1,260,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.	ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුවෙහි ඒකාකාරී මාර්ගයක 40mm ඝනකමට කාපට් ඇතිරීම සඳහා ඉතා කුඩා ප්‍රමාණයකට ABC යෙදීමට උපකල්පනය කර තිබුණත්, මාර්ගය ප්‍රායෝගිකව පරීක්‍ෂා කිරීමේදී කැඩී ගිය මාර්ගය දෙපස ඉතා විශාල වලවල් ප්‍රමාණයක් තිබුණු බවත්, ලද ප්‍රතිපාදන සීමාව තුළ ඇස්තමේන්තුව සංශෝධනය කර මුළු දිගටම නැවත ඇස්තමේන්තු සකස් කිරීම ඵලදායී නොවන බැවින්, මාර්ගයේ හරස්කඩ මුළු දිගටම ඇස්ෆෝල්ට් මෙට්‍රික් ටොන් 1500ක් පමණ අවශ්‍ය වන බැවින් ඇස්තමේන්තුව සංශෝධනය කර නියමිත උස, නියමිත හැඩය හා ප්‍රමිතිය පවත්වාගෙන ඵලදායීව නිම කළ හැකි උපරිම දුර වන 920mක් පමණ සංවර්ධනය කළ බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා අවිධිමත් පරිදි ගෙවීම් කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනීමටත් පියවර ගත යුතුය.
(ii)	මුළු මාර්ග තලයට ABC ඇතිරීම සඳහා ඝන මීටර් 100 ක ප්‍රමාණයක් ඇස්තමේන්තු කර තිබුණද, මාර්ගයෙන් සියයට 43 ක ප්‍රමාණයක් ඉදිකර නොතිබියදී මුළු මාර්ග තලය සඳහාම ABC ඝන මීටර් 290 ක් සඳහා රු.1,885,000 ක මුදලක් ගෙවා තිබුණි.	ප්‍රතිපාදන ලබාදීමට යොදාගත් RDA ඇස්තමේන්තුවේ දෝෂ සහිත ස්වභාවය හා එය නිවැරදි කිරීමට ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් මෙම තත්වය මතු වූ බවත්, මාර්ගය පළල් කිරීමට හා වලවල් වැසීමට ABC ඝන මීටර් 290 ක් වැය වූ බව.	- එම -
(iii)	ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක 05 අනුව මීටර් 135 ක් දිගට කාණුවක් ඉදිකිරීම වෙනුවෙන් රු.877,500 කට හා වැඩ විෂයය අංක 13 අනුව මාර්ගයේ දෙපස උරහිස් සකස් කිරීම සඳහා කොන්ක්‍රීට් ඝන මීටර් 30 ක් වෙනුවෙන් රු.90,000 කට ගිවිසුම්ගත වී තිබුණද, එම වැඩ විෂයයන් ඉටු කර නොතිබුණි.	ප්‍රතිපාදන වෙන් කිරීමට සකස් කළ ඇස්තමේන්තුවෙහි අඩංගු බොහෝ කරුණු ප්‍රායෝගිකව මාර්ගය සඳහා නොගැලපීම මත එහි සඳහන් අයිතමයන් ඉටු කිරීමේ අපහසුතාවයක් මතු වූ බවත්, මාර්ගය සඳහා උපරිම ඉඩක් ලබා ගැනීම සඳහා ABC දෙපසට පුරවා සකස් කළ බවත්, කොන්ත්‍රාත් කාලයේදී ලද වර්ෂාව නිසා ඇස්තමේන්තුවෙහි සඳහන් කාණුව ඉදිකිරීම නිශ්ඵල කාර්යයක් වන බැවින් පිහිටි කාණු පද්ධතිය ශුද්ධ කර ජලය බැස යාමට සැලැස්වූ බව.	විධිමත් පරීක්ෂාවකින් තොරව අස්තමේන්තු සැකසූ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගත යුතුය.

(iv)	මාර්ගයේ උරහිස් හා කාණු ඉදි නොකිරීමට හා ගිවිසුම්ගත මාර්ගයෙන් කොටසක් පමණක් ඉදිකිරීමට, විධිමත් අනුමැතියක් ලබා නොගැනීම, මාර්ග ඉදිකිරීමට අදාළ සම්මත පිරිවිතරයන් අනුව, ඇස්ෆල්ට් මිශ්‍රණ සැලැස්ම කොන්ත්‍රාත්කරු වෙත ලබා නොදීම, ඇස්ෆල්ට් අතුරන මාර්ග තලය සෑම මීටර් 05 ක පරතරයකින් යුතුව මැනුම් නොකිරීම, සම්මත පිරිවිතර අනුව මාර්ගයේ ඇස්ෆල්ට් ඇතිරීමට පෙර වැඩ බිමට ගෙනෙන ඇස්ෆල්ට් වල උෂ්ණත්වය පරීක්ෂා නොකිරීම වැනි අඩුපාඩු කර්මාන්තයේ පැවතුණි.	මාර්ගය ඉදිකිරීමේදී සිදු වන ප්‍රායෝගික වෙනස්කම් සඳහා අනුමැතිය ලබා ගත් බවත්, ඉංජිනේරු අංශයේ පවතින උපකරණ හා කාර්ය මණ්ඩලයේ පවතින ඌනතාවයන් මිශ්‍රණ සැලැස්ම සකස් කිරීම සඳහා බලපෑ බවත් ඇස්ෆල්ට් ඇතිරීමට පෙර උෂ්ණත්වය පරීක්ෂා කළද, වාර්තා තබා ගැනීමට නොහැකි වූ බව.	ඇස්තමේන්තුවේ සඳහන් පිරිවිතරයන් වෙනස් වුන විට සංශෝධිත ඇස්තමේන්තු සකස් කර අනුමැතිය ලබා නොගැනීම, මිශ්‍රණ සැලැස්ම සකස් කර කොන්ත්‍රාත්කරු වෙත ලබා නොදීම හා උෂ්ණත්වය පරීක්ෂා නොකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශව වෙත විධිමත් පියවර ගත යුතුය.
(ඊ)	තලපියන්නාව ගුඩ්හොප් මාවත ඇස්ෆල්ට් අතුරා සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.17,479,435 ක මුදලකට කොන්ත්‍රාත්තරුවෙකු සමඟ ගිවිසුම්ගත වී ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.12,556,150 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.		
(i)	මාර්ග තලය මීටර් 1600 ක් දිගට, මීටර් 3.25 ක් පළලට සහ මාර්ග දෙපස උරහිස් මීටර් 0.3 ක් පමණ පළලට සකස් කිරීම සඳහා ගිවිසුම්ගත වී තිබුණද, මාර්ගයෙන් සියයට 70 ක ප්‍රමාණයක් ඉදිකර නොතිබුණු අතර මීටර් 480 ක් පමණ ඉදිකර තිබුණි. ඇස්තමේන්තු වැඩ විෂයය අංක 4.1 අනුව මාර්ගයේ උරහිස් මීටර් 0.3 ක පළලින් සකස් කිරීම වෙනුවෙන් රු.630,000 කට හා වැඩ විෂයය අංක 06 හා 07 යටතේ කාණු හා පැති බැම්ම ඉදිකිරීම වෙනුවෙන් රු.1,462,384 කට ගිවිසුම්ගත වී තිබුණද, එම වැඩ විෂයයන් ඉටු කර නොතිබුණි.	මාර්ගය ඉදිකිරීමට ඇස්තමේන්තු සකස් කිරීමේදී මාර්ගය නාය යාමට ලක්ව නොතිබූ අතර ඉන් පසු ඇති වූ අධික වර්ෂාව නිසා මාර්ගයේ මැද කොටස නායයාමට ලක්වූ බවත්, මාර්ගයේ ගමන් කිරීමට ද නොහැකි වූ බැවින් එක් පැත්තක සිට නාය ගිය ස්ථානය දක්වා මාර්ගය සකස් කළ බවත්, නියමිත දිනට මාර්ගය සම්පූර්ණයෙන් ඉදිකිරීමට නොහැකි වූ බව. ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා භාවිතා කළ ඇස්තමේන්තුවෙහි වැඩ විෂයන් ප්‍රායෝගිකව ඉටු කිරීමේ අපහසුතාවයක් මතු වූ බවත්, උපරිම ඉඩක් ලබා ගැනීම වෙනුවෙන් ABC දෙපසට පුරවා සකස් කරන ලද අතර, දක්වා ඇති කාණුව ඉදි කිරීමට ප්‍රමාණවත් ඉඩක් නොවූ අතර පිහිටි කාණු පද්ධතිය ශුද්ධ කර ජලය බැස යාමට සැලැස්වූ බව.	සංශෝධිත ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු නොකළ නිලධාරීන් සඳහා විධිමත් පියවර ගත යුතුය.

(ii)	මුළු මාර්ග තලය සඳහා ABC යෙදීමට ඝන මීටර් 100 කට ඇස්තමේන්තු කර ගිවිසුම්ගත වී තිබුණු අතර, මාර්ගයෙන් සියයට 30 ක් ඉදිකිරීම වෙනුවෙන් ඝන මීටර් 375 කට රු.2,700,000 ක මුදලක් ගෙවා තිබුණි. එය ගිවිසුම්ගත ABC ප්‍රමාණය සියයට 1150 කින් ඉක්මවා යෑමකි.	මාර්ගයේ වලවල් වැසීමට සහ මාර් ගයේ පළල වැඩි කිරීමට අමතර ABC ප්‍රමාණයක් වැය වූ බව.	- එම -
(iii)	මාර්ගයේ උරහිස් හා කාණු ඉදි නොකිරීමට විධිමත් අනුමැතියක් ලබා නොගැනීම ගිවිසුම්ගත මාර්ගයේ දිගින් කොටසක් පමණක් ඉදිකිරීම, මාර්ග ඉදිකිරීම සම්බන්ධ සම්මත පිරිවිතර අනුව ඇස්ෆල්ට් මිශ්‍රණ සැලැස්ම කොන්ත්‍රාත්කරු වෙත ඉදිරිපත් නොකිරීම, ඇස්ෆල්ට් අතුරන මාර්ග තලය මීටර් 05 ක පරතරයකින් මැනුම් නොකිරීම, සම්මත පිරිවිතර අනුව වැඩ බිමට ගෙන එන ඇස්ෆල්ට්වල උෂ්ණත්වය පරීක්ෂා නොකිරීම වැනි අඩුපාඩු කර්මාන්තයේ පැවතුණි.	මාර්ගය ඉදිකිරීමේදී සිදු වන ප්‍රායෝගික වෙනස්කම් සඳහා අනුමැතිය ලබා ගත් බවත්, ඉංජිනේරු අංශයේ පවතින උපකරණ හා කාර්ය මණ්ඩලයේ පවතින ඌනතාවයන් මිශ්‍රණ සැලැස්ම සකස් කිරීම සඳහා බලපෑ බවත් ඇස්ෆල්ට් ඇතිරීමට පෙර උෂ්ණත්වය පරීක්ෂා කළද, වාර්තා තබා ගැනීමට නොහැකි වූ බව.	ඇස්තමේන්තුවේ සඳහන් පිරිවිතරයන් වෙනස් වනවිට සංශෝධිත ඇස්තමේන්තු සකස් නොකළ, ඇස්ෆල්ට් මිශ්‍රණ සැලැස්ම සකස් කර කොන්ත්‍රාත්කරු වෙත ලබා නොදීම හා උෂ්ණත්වය පරීක්ෂා නොකළ නිලධාරීන් සඳහා විධිමත් පියවර ගත යුතුය.

4.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කඳුකර දශකය 2024-2033 දශවිධ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කිරිමැටිය මැද පාරේ කාණු පද්ධතිය පුළුල් කර සංවර්ධනය කිරීම සඳහා හා කිරිමැටිය මැද පාරේ අතුරු මාර්ගයේ කාණු පද්ධතිය පුළුල් කර සංවර්ධනය කිරීම සඳහා පිළිවෙලින් රු.500,000 ක් හා රු.1,000,000 ක්ද, කිරිමැටිය මැද පාරේ ඇළ මාර්ගයේ බොක්කුව ඉවත් කර එම ස්ථානයට කුඩා පාලමක් ඉදිකිරීම සඳහා රු.3,000,000 ක්ද, වශයෙන් එකතුව රු.4,500,000 ක ප්‍රතිපාදන වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.		

(i)	කිරිමැටිය මැද පාරේ සහ අතුරු මාර්ගයේ කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු. 1,500,000 ක් වැය කර තිබුණද, "U" හැඩයේ කාණු වෙනුවට "L" හැඩයේ කාණු පද්ධතියක් ඉදිකිරීම හේතුවෙන් මාර්ගය දෙසට ජලය පිටාර ගැලීම සිදු වී තිබුණි.	මෙම ඇළ මාර්ගය "U" හැඩාකාරව ඉදිකළ යුතු වුව ද ඇළ මාර්ගය හරහා ග්‍රාමයට පිවිසීමට මාර්ගයක් පැවතීම නිසා එම මාර්ගය දෙසට ඇළ බැම්ම ඉස්සූ විට පවතින වංගු සහිත ස්ථානයේ වාහන අයින් කිරීමේදි වාහනවල බද ස්පර්ශ වන බැවින් හා ඇළේ අනිත් පසින් පවතින ඉවුරේ පස සෝදා ඇළට ඒම වැළැක්වීමට ආධාරක බැමි 2ක් උඩට උස්සා ඇස්තමේන්තු සකස් කර ඇති බවත්, මෙම ඉදිකිරීම සිදු කිරීමෙන් අනතුරුව වර්ෂා කාලවලදී ජලය මාර්ගය දෙසට ගලා යෑම වැළකී ජලය නිසි පරිදි ඇළ මාර්ගය ඔස්සේ ගලා යෑම සිදුවන අතර ඇළට පස් සෝදා යෑමෙන් ඇළ මාර්ගය අවහිර වීමද වැළකී ඇති බව.	පූර්ව අධ්‍යයනයක් සිදු කර නිවැරදිව ඇස්තමේන්තු සකස් නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගත යුතුය.
(ii)	කිරිමැටිය මැද පාරේ ඇළ මාර්ගය රු. 1,000,000 වැය කර 2010 වර්ෂයේදී ඉදිකරන ලද ඉතා හොඳ තත්ත්වයේ පැවති බෝක්කුව අවශ්‍යතාවයක් නොමැතිව කඩා ඉවත් කර තිබුණි.	2010 වර්ෂයේ ගුරුදෙණිය බටහිර වසමේ කිරිමැටිය ගම්මානයට යන මාර්ගය සඳහා අදාළ ස්ථානයේ බෝක්කුව සවිකර මාර්ගය සංවර්ධනය කර ඇති බවත්, දෙළුම්වත්ත නැමති ඉඩම තුළ නිවාස සංකීර්ණයක් ඉදි කිරීමෙන් අනතුරුව වර්ෂා කාල වලදී එම ප්‍රදේශයෙන් ගලා එන ජලය හේතුවෙන් එම බෝක්කුව ප්‍රමාණවත් නොවීමෙන් ජලය පිටාර ගලා යන බව.	විධිමත් පරීක්ෂාවක් පවත්වා අදාළ පාර්ශව වෙත පියවර ගත යුතුය.

(ආ)	2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පවුල් ලක්ෂ 02 ක් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක පවුල් 4,741 ක් සඳහා ප්‍රතිලාභ ලබා දී තිබුණද, 2024 දෙසැම්බර් 31 දින වන විට එම වැඩ සටහනට අදාළව අක්‍රීය ප්‍රතිලාභීන් ගණන 542 ක් හෙවත් සියයට 11 ක් විය.	කොවිඩ් වසංගත තත්වය නිසා ප්‍රතිලාභීන් පිරිසකගේ ව්‍යාපෘති අක්‍රීය වී ඇති බවත්, මේවන විට එම ව්‍යාපෘති සක්‍රීය කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව.	විධිමත් අධීක්ෂණයක් සිදු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත්, විධිමත් වැඩපිළිවෙලක් යොදා අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමටත් පියවර ගත යුතුය.
(ඇ)	සෞභාග්‍යා නිෂ්පාදන වැඩසටහන යටතේ 2021 හ 2022 වර්ෂවලදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ප්‍රතිලාභීන් 34 දෙනෙකු සඳහා ලබා දෙන ලද එකතුව රු. 1,657,312 ක වර්ග 30 ක උපකරණ 166 ක්ද, එක් ගමකට එක් ව්‍යවසායකයෙකු බිහි කිරීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ප්‍රතිලාභීන් 08 දෙනෙකු සඳහා ලබා දෙන ලද රු. 937,044 ක වර්ග 09 ක උපකරණ 25 ක් නිෂ්කාර්යව පැවතුණි.	කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ආර්ථිකය කඩා වැටීම, ප්‍රතිලාභීන් මිය යාම්, රැකියා අවස්ථා සඳහා විදේශගත වීම් හා අමුද්‍රව්‍ය මිල වැඩි වීම් හේතුවෙන් ප්‍රතිලාභීන් පිරිසකගේ ව්‍යාපෘති අක්‍රීය වී ඇති බවත්, මේවන විට එම ව්‍යාපෘති සක්‍රීය කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව හා තව දුරටත් අක්‍රීය තත්වයේ පවතින ව්‍යාපෘති වල යන්ත්‍ර හා උපකරණ වෙනත් සුදුසු ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු සිදු කරමින් පවතින බව.	- එම -

4.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත රු. 672,340,482 ක ව්‍යාපෘති 1,388 න් ක්‍රියාත්මක කර තිබුණේ, රු. 579,977,197 ක් වටිනා ව්‍යාපෘති 1,215 ක් පමණි. විවිධ ව්‍යාපෘති යටතේ ප්‍රතිපාදන වෙන් වූ රු.92,363,345 ක ව්‍යාපෘති 173 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.	ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය මඟින් ව්‍යාපෘති තනතර කරන ලෙස දැන්වීම, ජනාධිපති කාර්යාලය මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම, ප්‍රතිපාදන වෙන් කර ඇති සමිති ලියාපදිංචි සමිති නොවීම, සමිති මූල්‍යමය වශයෙන් ශක්තිමත්	ලැබෙන ප්‍රතිපාදන පූර්ණ උපයෝජනය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.

		නොවීම ආදී කරුණු හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව.	
(ආ)	තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මීගහහේන විද්‍යාලයේ ක්‍රීඩාපිටියේ නැරඹුම් මැදිරියක් ඉදිකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 972,000 ක මුදලක් වැය කර ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කර නොතිබුණි.	ව්‍යාපෘතියට වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයට සරිලන ආකාරයෙන් සකස් කරන ලද ඇස්තමේන්තුවට අනුව අදාළ වැඩ නිමකර ඇති බවත්, ඉදිරියේදී ප්‍රතිපාදන ලැබීමේදී මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් වැඩ නිම කිරිමට කටයුතු කරන බව.	විධිමත් වැඩපිළිවෙලක් යොදා ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් ශ්‍රියාගම, වසමේ අලිමාන තෘණ මගින් පරිසර හිතකාමී කඩදාසි නිෂ්පාදන ව්‍යාපෘතියට අදාළව කඩදාසි එකතු කිරීමේ, ගබඩා කිරීමේ හා බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු. 5,814,890 ක වටිනාකමකට ගිවිසුම්ගත වී තිබුණද, ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක 11 සිට 49 දක්වා වූ රු. 3,800,560 ක් වටිනා වැඩ විෂයයන් 39 ක් නිම කිරීමට අපොහොසත් වී තිබුණි.	2024 වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාස වල ඇති වූ දැඩි සුළි කුණාටු හා අධික වර්ෂා තත්වය මත ව්‍යාපෘතිය අපේක්ෂිත මට්ටමට ඉටු කිරීමට නොහැකි වූ බව.	ව්‍යාපෘති කාලීනව ආරම්භ කර ක්‍රියාත්මක කිරීමටත්, විධිමත් වැඩපිළිවෙලක් යොදා ඉදි කිරීම නිම කිරීමටත් පියවර ගත යුතුය.

4.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් තැන්නලන්ද වසමට ප්‍රජා ජල ව්‍යාපෘතියක් ඉදිකිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත පවරා සමාලෝචිත වර්ෂය තුළ රු.19,885,000 ක් වූ සම්පූර්ණ මුදල ගෙවා තිබුණ අතර, මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.		
(i)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශයේ නියමයන්ගෙන් බැහැරව ඍජු කොන්ත්‍රාත් ක්‍රමය අනුගමනය කර තිබුණු අතර, 5.4.6 මාර්ගෝපදේශය අනුව සෑම ගෙවීමකදීම යම් නිශ්චිත මුදලක් රැඳවුම් ලෙස	ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන දිස්ත්‍රික්කයේ ලියාපදිංචි පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගි වීමට අවස්ථාව සලසා	විධිමත් පරීක්ෂණයක් පවත්වා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව කටයුතු කළ නිලධාරීන්ට පියවර

	රඳවාගෙන නොතිබුණි. 5.4.8 මාර්ගෝපදේශය අනුව ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට 5 කට නොඅඩු කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණු අතර, 8.14 මාර්ගෝපදේශය අනුව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි.	විවෘත ප්‍රසම්පාදනය මගින් තරඟකාරී ලංසු කැඳවීමකින් කොන්ත්‍රාත් පිරිනමා ඇති බවත්, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇති බව.	ගත යුතුය.
(ii)	මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2024 ජූලි 31 දින වන විට නිම කළ යුතු වුවද, විගණිත දින වූ 2025 මාර්තු 21 දින වන විටද ව්‍යාපෘතිය නිම කර නොතිබුණු අතර, රු.2,268,054 ක්වූ නළ ළිං දෙකක් පමණක් ඉදිකර තිබුණි.	මෙම පානීය ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විෂය භාර විවිධ අංශ මඟින් ක්‍රියාත්මක කරන අතර නළ ළිං ඉදිකිරීම එහි භූගත ජල අංශය මඟින් ක්‍රියාත්මක කරන බැවින් ඒ සඳහා ගෙවීම් ද සිදුකළ බවත්,මේ වන විට පොම්පාගාරය ඉදිකිරීමේ වැඩ අවසන් කර ඇති අතර, ජල නල සඳහා මිළ ගණන් කැඳවීම, මෝටරය ඇණවුම් කිරීම සිදු කර ඇති බවත් මෝටරය සවිකල පසු විදුලි සම්බන්ධතාවය ලබා දිමට විදුලි බල මණ්ඩලය එකඟතාවය පළ කර ඇති බව.	ව්‍යාපෘතිය කාලීනව නිම කර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධ පියවර ගැනීමටත්, විධිමත් වැඩපිළිවෙලක් යොදා ව්‍යාපෘතිය නිමකර ගැනීමට කටයුතු කිරීමත් කළ යුතුය.
(iii)	කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කිරීමකින්, බිල්පත්‍රයක් ඉදිරිපත් කිරීමකින් හෝ ගිවිසුමකට එළඹීමකින් තොරව රු.19,885,000 ක සම්පූර්ණ මුදලට ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවා තිබුණි. තවද, 2024 දෙසැම්බර් 31 දින රු.17,407,664 ක අවසන් ගෙවීම ගණකාධිකාරී විසින් සහතික කර නොතිබුණු බවද නිරීක්ෂණය විය.	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ලැබෙන ව්‍යාපෘතිවල වැඩ ආරම්භ කරනු ලබන්නේ චෙක්පතක් මඟින් මුදල් ගෙවූ පසුව වන බැවින් ව්‍යාපෘතියට අදාළ සමස්ත මුදලම ගෙවීම් කළ බව.	විධිමත් පරිදි ඉටු කළ වැඩ සඳහා පමණක් ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා 2017 අගෝස්තු 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමත/17/1578/716/03 මත පදනම්ව රු.29,775,000 ක මුදලකට ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය වෙත මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.		

(i)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12 මාර්ගෝපදේශය අනුව තරඟකාරීත්වයට හසු නොකොට, මේ සඳහා හැකියාවක් සහ සම්පත් පවතින කොන්ත්‍රාත්කරුවන් සිටියදී 2017 ලබා දුන් අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 8.14 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව 2024 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත් කාලය අවසන් වී තිබුණද, විගණන දින දක්වාම කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර නොතිබුණි. 5.4.4 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව රු.6,000,000 ක අත්තිකාරම් මුදලක් ගෙවීම් කර තිබුණද, ඒ සඳහා අත්තිකාරම් සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි. 5.4.6 මාර්ගෝපදේශය අනුව වැඩ සඳහා වූ සෑම ගෙවීමකදීම යම් නිශ්චිත මුදලක් අතරදවුම් ලෙස දෝෂ වගකීම් කාලසීමාව අවසන් වන තුරු රඳවාගත යුතු වුවද, කිසිදු රැඳවුම් මුදලක් රඳවාගැනීමකින් තොරව ගිවිසුම්ගත මුළු කොන්ත්‍රාත් මුදලම නිදහස් කර තිබුණි. 5.4.8 මාර්ගෝපදේශය අනුව රු.29,775,000 ක්වූ ඇස්තමේන්තුගත වටිනාකමට අදාළව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි.	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත චෙක්පතක් මඟින් මුදල් ගෙවූ පසු දින දීර්ඝ කිරීමක් සිදු නොකළ බවත්, ඉදිරියේදී මෙවැනි අඩුපාඩු වලින් තොරව කටයුතු කරන බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා අවිධිමත් පරිදි කටයුතු කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගත යුතුය.
(ii)	ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ වැඩ 2024 දෙසැම්බර් 31 දින වන විට නිම කළ යුතු වුවත්, කොන්ත්‍රාත් කාලය අවසන් වී මාස 03 කට වැඩි කාලයක් ගත වී තිබුණද වැඩ අවසන් කර නොතිබුණි.	2024 දෙසැම්බර් සහ 2025 ජනවාරි වන විට පැවති අධික වර්ෂාව නිසා නියමිත කාලසීමාව තුළ ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි වූ බව.	ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘතිය ඉටු කරවා ගැනීමට පියවර නොගත් නිලධාරීන්ට පියවර ගැනීමටත්, විධිමත් වැඩපිළිවෙලක් යොදා කඩිනමින් ව්‍යාපෘතිය නිම කර ගැනීමත් කළ යුතුය.
(iii)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 138 රෙගුලාසිය ප්‍රකාරව සහතික කිරීමකින් තොරව රු. 23,638,972 ක් ගෙවීම් කර තිබුණි.	විගණන නිරීක්ෂණය කාරුණිකව පිළිගන්නා බවත්, වර්ෂ අවසාන ගිණුම් පියවීමේ පැවති කාර්යය බහුලත්වය මත වවුචර් සහතික කිරීමේ නිලධාරියාගේ	මුදල් රෙගුලාසි අනුව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත

		අතපසුවීමකින් මෙම වවුචරය සහතික කිරීම මග හැරී ඇති බව.	යුතුය.
(iv)	භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය කළ පරිදි ප්‍රමාණ පත්‍රයේ C – 3 වැඩ විෂය යටතේ කොන්ක්‍රීට් ඝන මීටර් 6.7 ක මිලිමීටර් 225 x 225 කයිරු තලාදාය ඉදිකිරීමේදී (Plinth beam) ඉතාමත් දුර්වල ප්‍රමිතියෙන් යුක්ත වීමත්, ප්‍රමාණ පත්‍රයේ D – 1 වැඩ විෂය යටතේ ඝනමීටර් 175 කින් යුතු අත්තිවාරමේ කළුගල් බැම්ම කළුගල් අතර හිදැස් පවතින පරිදි සකස් කර බදාම තැවරීමකින් තොරව ඉතාමත් දුර්වල මට්ටමෙන් නියමිත ප්‍රමිතියෙන් බැහැරවත් පැවතිණි.	අධික වර්ෂාව පැවතීම හේතුවෙන් ඉදිකිරීම්වල යම් යම් දෝෂ පැවති බව	ව්‍යාපෘතිය අධීක්ෂණය කළ නිලධාරීන්ට පියවර ගැනීමත් ඉදිකිරීම්වල අඩුපාඩු නිවැරදි කිරීමටත් පියවර ගත යුතුය.

4.6 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 ක විශ්‍රාමිකයන් 194 දෙනෙකු වෙත වර්ෂ 01 ත් වර්ෂ 05 ත් අතර කාල පරාසයක් තුළ රු.43,891,319 ක විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණු අතර ඉන් රු.21,657,553 ක් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් අය කර නොතිබුණි.	වැඩිපුර ගෙවීම් අතරින් සියයට 80 කට වැඩි ප්‍රමාණයක් යුධ හමුදා වැටුප් සංශෝධනයේ හා වැටුප් ගෙවීම් මත සිදු වී ඇති අතර මෙම වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් වාරික වශයෙන් මාසිකව අය කරගෙන යන බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා වැඩිපුර ගෙවීම් නිලධාරීන්ගේ අවිධිමත්භාවය නිසා සිදු වී ඇත්නම්, ඊට පියවර ගැනීමත්, චක්‍රලේඛ ප්‍රකාරව වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කර ගැනීමත් කළ යුතුය.
(ආ)	2023 හා 2024 වර්ෂවලදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක විශ්‍රාමිකයින් සඳහා විදෙස්ගත විශ්‍රාමිකයින්ට ජීවන වියදම් දීමනාව හා විශේෂ දීමනාව ලෙස විශ්‍රාමිකයන් 35 කට රු. 367,270 ක මුදලක් වැඩියෙන්ද විදෙස්ගත විශ්‍රාමිකයන් 50 කට රු. 696,412 ක් අඩුවෙන්ද ගෙවා තිබුණි.	වැඩිපුර ගෙවීම් මේ වන විට වාරික වශයෙන් අය කරන බවත්,අඩුවෙන් ගෙවා ඇති මුදල් නැවත පරීක්ෂා කර අදාළ විශ්‍රාමිකයන් මෙරටට පැමිණීමෙන් පසුව ගෙවීම් කිරීමට කටයුතු කර ඇති බව.	විශ්‍රාම වැටුප් නිවැරදිව ගණනය කිරීමට කටයුතු කළ යුතු අතර, විධිමත් පරීක්ෂණයක් කර වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කර ගැනීමටත්, අඩුවෙන් ගෙවීම් නිවැරදි කිරීමටත් පියවර ගත යුතුය.

(ඇ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 කට අයත් ඉඩම් කොටස් 1790 ක් වසර 01 සිට වසර 27 ක කාලයක් ගත වී ඇතත් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.	ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු වල විවිධ පාර්ශවයන් (ආයතන) සම්බන්ධ වන බැවින් අත්පත් කර ගැනීමේ කටයුතු ප්‍රමාද වී ඇති බවත්, අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කළ හැකි බව.	ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ කටයුතු කඩිනමින් කිරීමට ක්‍රියා කළ යුතු වීම.
(ඈ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක ඉඩම් කොටස් 542 ක් වසර 01 ත් වසර 15 ත් අතර කාලයක් ගත වී තිබුණද, පවරා දීමේ කටයුතු අවසන් කර නොතිබුණි.	ඉඩම් මැනුම් කටයුතු ප්‍රමාද වීම හා ඉල්ලීම් වල පවතින අඩුපාඩු හේතුවෙන් ඉඩම් පැවරීම් කටයුතු ප්‍රමාද වී ඇති බවත්, ඉඩම් පැවරීම් කටයුතු කඩිනම් කිරීමට කටයුතු කරන බව.	ඉඩම් පැවරීම සම්බන්ධ කටයුතු කඩිනමින් කිරීමට ක්‍රියා කළ යුතු වීම.
(ඉ)	මහනුවර දිස්ත්‍රික්කයේ නාය යෑම් අධි අවදානම් තත්ත්වයන් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක පවුල් 1,539 ක් හඳුනාගෙන තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක පවුල් 259 ක් පමණක් නැවත පදිංචි කිරීම සිදු කර තිබුණි. පවුල් 219 ක් විකල්ප අවස්ථා අනුව පදිංචිය සඳහා යොමු වී තිබුණු අතර තව දුරටත් අධි අවදානම් ප්‍රදේශවල පදිංචි පවුල් සංඛ්‍යාව 1319 ක් විය.	දීර්ඝ කාලයක් අදාළ ස්ථානවලට කිසිදු ආකාරයේ ආපදා තත්වයක් ඇති නොවීම, ඔවුන්ගේ ජීවනෝපාය කටයුතු අදාල පදිංචි ප්‍රදේශය ආශ්‍රිතවම සිදු කර ගැනීම හේතුවෙන් එම නිවාස වලින් ඉවත්වීමට අකමැති බව.	අධි අවදානම් ප්‍රදේශවල පදිංචි වූවන් නැවත පදිංචි කිරීමට කටයුතු කළ යුතු වීම.
(ඊ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක ඉඩම් කැබලි 53 ක වන්දි මුදල් ගෙවීම් හා අත්පත් කර ගැනීමට අනුමැතිය ලද දින හා ප්‍රතිපාදන මුදල් ගෙවූ දින අතර මාස 02 සිට වර්ෂ 22 දක්වා ප්‍රමාදවීම් හේතුවෙන් අත්පත් කර ගැනීමට අදාළ රු. 259,985,297 ක් වූ වන්දි මුදලට අමතරව ඉඩම් කැබලි 36 ක් සඳහා රු. 167,241,969 ක පොළී මුදලක්ද ගෙවීම් කර තිබුණි.	අත්පත් කර ගැනීමේ කටයුතු වලදී විවිධ පාර්ශවයන් සම්බන්ධ වන බැවින් මෙම කටයුතු ප්‍රමාද වන බවත්, මේ හේතුවෙන් පොළී මුදල් ගෙවීමට සිදු වී ඇති බව.	වන්දි මුදල් නියමිත පරිදි ගෙවීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.
(උ)	2024 මාර්තු 28 දිනැති අංක 06/2024 දරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ප්‍රාදේශීය ලේකම්වරුන්ට මසකට රු. 15,000 බැගින් 2024 වර්ෂයට දීමනාවක් ගෙවා තිබුණි. එසේ තිබියදී 2014 ජනවාරි 31 දිනැති අංක ESI/8/Allowance/03/121 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව ග්‍රාමීය මට්ටමේ සංවර්ධන ව්‍යාපෘති දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමෙන්	චක්‍රලේඛ උපදෙස් අනුව අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්, චක්‍රලේඛනයට පටහැනිව වැඩිපුර ගෙවා ඇත්නම් එම මුදල් කඩිනමින් අය කිරීමට කටයුතු කරන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇති බව.	එකම කාලපරිච්ඡේදය තුළ එකම කාර්යයක් වෙනුවෙන් දීමනා දෙකක් ලබා නොගත යුතු අතර, විධිමත් පරීක්ෂාවක් කර වැඩිපුර ගෙවා ඇති මුදල් අයකළ යුතුය.

	සම්බන්ධීකරණය කරමින් මනා වියදම් කළමනාකරණයකින් හා අධීක්ෂණයකින් යුතුව නියමිත කාලය තුළ නිම කිරීම සඳහා මෙම ප්‍රාදේශීය ලේකම්වරුන්ට මාසිකව රු. 5,000 බැගින් රු. 250,000 ක දීමනාවක්ද ගෙවා තිබුණි.		
(ඌ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්තිවල නියමයන්ගෙන් බැහැරව සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකු වෙත ලබා දී තිබුණු රු. 196,661 ක ණය ශේෂ නිරවුල් කර නොතිබුණි.	නිලධාරීන් දෙදෙනෙකුගෙන් එකතුව රු. 196,661 ක් අයකර ගැනීමට ඇති බව.	ණය නිරවුල් කර ගැනීම සඳහා කාලීනව කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත්, කඩිනමින් ණය ශේෂ නිරවුල් කර ගැනීමටත් කටයුතු කළ යුතුය.

5. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක වැඩිහිටි දීමනා වශයෙන් ප්‍රතිලාභීන් 6,534 ක් සඳහා රු.22,554,400 ක මුදලක්ද, ආබාධිත දීමනා වශයෙන් ප්‍රතිලාභීන් 802 ක් සඳහා රු.6,015,000 මුදලක්ද, වකුගඩු දීමනා වශයෙන් ප්‍රතිලාභීන් 179 ක් සඳහා රු.1,342,500 ක මුදලක්ද 2024 දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතුව පැවතුණි.	දීමනා ලබා ගත් ප්‍රතිලාභීන්ගෙන් කොටසක් අස්වැසුම වැඩසටහන සඳහා තේරීපත්ව තිබූ බැවින් 2024 නොවැම්බර් හා දෙසැම්බර් මාස වලට අදාළ දීමනා ගෙවීම් නොකළ බවත්, නමුත් එක් එක් හේතූන් මත අස්වැසුම ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වූ බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර නියමිත ප්‍රතිලාභීන්ට අදාළ ප්‍රතිලාභ ගෙවීමට කටයුතු කළ යුතුය.
(ආ)	1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත හා 2016 අංක 08 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 5.2 වගන්තිය අනුව වයස අවුරුදු 15 ට වැඩි සෑම පුද්ගලයෙකු සඳහාම ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක වයස අවුරුදු 15 ත් 40 ත් අතර පුද්ගලයින් 59 ක්, වයස අවුරුදු 41 ත් 60 ත් අතර පුද්ගලයින් 249 ක්,	අවු. 60 ට වැඩි පුද්ගලයන් සඳහා වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කර ඇති බැවින් ජාතික හැඳුනුම්පත් ලබා ගැනීමට පුද්ගලයන් උනන්දුවක් නොදක්වන බවත්, ආබාධිත පුද්ගලයන් සඳහා ජාතික හැඳුන්ම්පත් නිකුත් කිරීමට අවශ්‍ය ඡායාරූප ලබා ගැනීමේ අපහසුතාවයක් පැවතීම හා හැඳුනුම්පතක් සකස් කිරීමට	පනතේ විධිවිධාන අනුව කටයුතු සිදු කර මහජනතාවට සේවාව සැපයීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය.

වයස අවුරුදු 61 ට වැඩි පුද්ගලයින් 508 ක් හා ආබාධිත පුද්ගලයින් 50 ක් වශයෙන් පුද්ගලයින් 866 ක් වෙත 2024 දෙසැම්බර් 31 දින වන විටත් හැඳුනුම්පත් නිකුත් කර නොතිබුණි.	එම පුද්ගයින් හට අවශ්‍යතාවයක් නොතිබීම, ලේඛන වල පවතින අඩුපාඩු හේතුවෙන් හා හැඳුනුම්පත් සකස් කිරීමට උනන්දුවක් නොදැක්වීම හේතුවෙන්, වයස අවු. 15ට වැඩි 60ට අඩු පුද්ගලයින් හැඳුනුම්පත් සකස් කර නොමැති බව.

6. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 හි 2024 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය හා සැසඳීමේදී පුරප්පාඩු 359 ක් හා සංවර්ධන නිලධාරී තනතුරෙහි අතිරික්ත 322 ක් පැවතුණි.	මේ සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව.	කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර අවශ්‍ය පුරප්පාඩු පිරවීමටත්, අතිරික්ත කාර්ය මණ්ඩල වෙනත් ආයතනවලට අනුයුක්ත කිරීමටත් පියවර ගත යුතුය.
(ආ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක නිලධාරීන් 10 දෙනෙකු වාර්ෂික සමාලෝචන වාර්තා හා නිවාඩු වාර්තා නොලැබීම සහ සේවය ස්ථිර කිරීමට අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් සේවය ස්ථිර කර නොතිබුණි.	අදාළ වාර්තාව නිලධාරීන් ගෙන්වා ගෙන අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට නියමිත බව.	ප්‍රමාදයන් වළක්වා විධිමත් පරිදි සේවය ස්ථිර කිරීමට කටයුතු කළ යුතු වීම.